# තරණය

ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය 2025 - හතරවන කලාපය

**ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන යටතේ සහභාගිත්ව ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය කෑගල්ලට .......**

ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන තුළ සිටින ප්‍රතිලාභී ප්‍රජාව ආර්ථික හා සමාජීය වශයෙන් සවිබලගැන්වීම උදෙසා කෑගල්ල ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයට අයත් ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් රාජකාරිවල නිරතවන ආර්ථික සංවර්ධන නිලධාරීන් සඳහා සහභාගිත්ව ව්‍යවසායකත්ව කුසලතා සහ ප්‍රජාව ආර්ථික සමාජීය වශයෙන් බල ගැන්වීමට අදාළ සැලසුම් සැකසීමේ පුහුණු වැඩසටහන 2025.10.01 හා 02 දෙදින පිළිමතලාව ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ඩබ්.කේ.එන්.එන්. කෞශල්‍යා මහත්මියගේ මුලිකත්වයෙන් පවත්වන ලදි.

පුහුණු හා පර්යේෂණ නිලධාරී ඩී.ඒ.පී.දාස්වත්ත මහත්මිය හා පුහුණු හා පර්යේෂණ නිලධාරී කේ.එම්.ජී.සමරසේන මහතා විසින් පුහුණුව සඳහා සම්පත් දායකත්වය ලබා දෙන ලදි. එස්.බී.එන්.එම්.ආනන්ද මෙනවිය විසින් පුහුණුව සම්බන්ධීකරණය සිදු කරන ලදි.









## ව්‍යවසායකත්ව වැඩි දියුණු කිරීම හා ශක්තිමත් කිරිමේ පුහුණුකරු පුහුණුව .........

2025.10.08, 09, 10 යන දිනයන්හි පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානයේදී පුහුණුකරු පුහුණුව පවත්වන ලදි. විපර්යකාරක වැඩසටහන යටතේ ගොඩනැගුණු ප්‍රජාමූල සංවිධාන සාමාජිකයන් සඳහා පැවති මෙම පුහුණු වැඩමුළුව සඳහා කුරුණෑගල, මහනුවර, බදුල්ල, ගාල්ල හා මාතර යන දිස්ත්‍රික්කයන්හි ප්‍රජා මූල සංවිධාන සාමාජිකයන් සහභාගි විය. මෙහි සම්පත් දායකත්වය පුහුණු හා පර්යේ්ෂණ නිලධාරී ඩබ්.එච්.සිරිසේන මහතා සහ පුහුණු හා පර්යේ්ෂණ නිලධාරී මංගලිකා වනසුන්දර, පුහුණු හා පර්යේ්ෂණ නිලධාරී චම්පා අල්විස් මහත්මිය හා පුහුණු හා පර්යේෂණ නිලධාරී ප්‍රේමානි දාස්වත්ත මහත්මිය විසින් ලබා දෙන ලදි.













## ප්‍රජාශක්ති ජාතික වැඩසටහන යටතේ පුහුණු සංචිත ස්ථාපිත කිරිම සඳහා පුහුණුකරුවන් පුහුණු කිරිමේ වැඩමුළුව

2025.10.10 වන දින ප්‍රජාශක්ති ජාතික ව්‍යාපාරය යටතේ දිස්ත්‍රික් පුහුණු සංචිත ස්ථාපිත කිරිම සඳහා පුහුණුකරුවන් පුහුණු කිරිමේ වැඩසටහනක් පිළිබඳ සාකච්ඡාවක් ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේදී පවත්වන ලදි. ජනාධිපති ලේකම් කාර්යාලයේ නිලධාරීන්, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ නිලධාරින්, ග්‍රාමිය සංවර්ධන කාර්යංශයේ නිලධාරින් සහ ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ නිලධාරින් මේ සඳහා සම්බන්ධ විය.








# ප්‍රජාශක්ති ජාතික වැඩසටහන යටතේ පළාත් පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩමුළුව

ජනාධිපති ලේකම් කාර්යාලය, ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ හා ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශය හා, ග්‍රාමීය සංවර්ධන කාර්යංශය හා ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය ඒකාබද්ධව ප්‍රජාශක්ති ජාතික වැඩසටහනට අදාළ පළාත් පුහුණුකරුවන් පුහුණු කිරීමේ දෙදින නේවාසික පුහුණු වැඩමුළුව 2025.10.16 හා 17 වන දින පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානයේදී පවත්වන ලදී.

මධ්‍යම පළාතට අයත් මහනුවර, මාතලේ හා නුවරඑළිය දිස්ත්‍රික්කවලට අදාළ සැලසුම් අධ්‍යක්ෂ හා නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්, සබරගමු පළාතට අයත් රත්නපුර හා කෑගල්ල දිස්ත්‍රික්කවලට අදාළ අධ්‍යක්ෂ හා නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් හා පළාත් සභා නියෝජනය කරන ලද නිලධාරින් පුහුණුව සඳහා සහභාගී විය.








## සමාජ සජීවිකරණ පුහුණුව

### රත්නපුරට හා පුත්තලමට............

ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහනේ නිරත වන ක්ෂේත්‍ර නිලධාරි සඳහා සමාජ සජීවිකරණ පුහුණු වැඩමුළුව 2025.10.15, 16 හා 17 යන දිනයන්හි ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේදී පැවැත්විණ. මේ සඳහා රත්නපුර හා පුත්තලම දිස්ත්‍රික්කයන්හි තෝරාගත් වසම් 10ක ක්ෂේත්‍ර නිලධාරින් සම්බන්ධ වු අතර සම්පත් දායකත්වය පුහුණු පර්යේෂණ නිලධාරී සුනන්ද සිරිසේන මහතා, පුහුණු පර්යේෂණ නිලධාරී නිහාල් විරසුරිය මහතා, පුහුණු හා පර්යේෂණ නිළධාරී චිත්‍රා ජයසිංහ මහත්මිය හා පුහුණු හා පර්යේෂණ නිලධාරී මංගලිකා වනසුන්දර මහත්මිය විසින් ලබා දෙන ලදි.







### කොළඹ, කළුතර, ගාල්ල හා මාතරට ........

2025.10.28, 29 හා 30 යන දිනයන්හි ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහනේ නිරත වන ක්ෂේත්‍ර නිලධාරි සඳහා සමාජ සජීවිකරණ පුහුණු වැඩමුළුව ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේදී පැවැත්විණ. මේ සඳහා කොළඹ, කළුතර, ගාල්ල හා මාතර දිස්ත්‍රික්කයන්හි තෝරාගත් වසම් කිහිපයක ක්ෂේත්‍ර නිලධාරි සම්බන්ධ වු අතර සම්පත් දායකත්වය පුහුණු පර්යේෂණ නිලධාරී ඒ.එම්.එස්.අතපත්තු මහතා, පුහුණු පර්යේෂණ නිලධාරී නිහාල් විරසුරිය මහතා, පුහුණු හා පර්යේෂණ නිළධාරී චිත්‍රා ජයසිංහ මහත්මිය හා පුහුණු හා පර්යේෂණ නිලධාරී ප්‍රියශාන්ත කාරියවසම් මහතා විසින් ලබා දෙන ලදි.







# සමාජ සජීවිකරණ පුහුණුව

## කළුතර දිස්ත්‍රික්කයට........

ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහනේ නිරත ක්ෂේත්‍ර නිලධාරීන් සඳහා සමාජ සජීවිකරණ පුහුණු වැඩමුළුව 2025.11.12, 13 හා 14 තෙදින බොරැල්ල පුහුණු මධ්‍යස්ථානයේදී පවත්වන ලදි. මේ සඳහා කළුතර දිස්ත්‍රික්කයේ ක්ෂේත්‍ර නිලධාරින් සම්බන්ධ වූ අතර මෙහි සම්පත් දායකත්වය පුහුණු නිලධාරී ආර්.එම්.කේ.බණ්ඩාර මහතා විසිනි.





## ගාල්ල දිස්ත්‍රික්කයට........

2025.11.24, 25 හා 26 තෙදින ගාල්ල දිස්ත්‍රික්කයේ ඉමදුව, යක්කලමුල්ල, බලපිටිය යන ප්‍රාදේශිය ලේකම් කාර්යාලයන්හි ක්ෂේත්‍ර නිලධාරින් පුහුණුව සඳහා සහභාගි විය. පුහුණව සඳහා සම්පත් දායකත්වය පුහුණු හා පර්යේෂන නිලධාරී ඒ.එම්.එස්.අතපත්තු මහතා, පුහුණු හා පර්යේෂණ නිලධාරී නිහාල් වීරසුරිය මහතා, පුහුණු හා පර්යේෂණ නිලධාරී ප්‍රියශාන්ත කාරියවසම් මහතා, පුහුණු හා පර්යේෂණ නිලධාරී චිත්‍රා ජයසිංහ මහත්මිය විසින් ලබා දෙන ලදි.







## ධාරිතා සංවර්ධන වැඩසටහන යටතේ පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ වැඩමුළුව

2025.10.27 වන දින ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ඩබ්. කේ. එන්. එන්. කෞශල්‍යා මහත්මියගේ මුලිකත්වයෙන් මෙම පුහුණු වැඩමුළුවේ තුන්වන අදියර පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානයේදී පවත්වන ලදී.

පුහුණුව සඳහා සම්පත් දායකත්වය පේරාදෙණිය විශ්ව විද්‍යාලයේ සමාජ විද්‍යා අධ්‍යයන අංශයේ ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යය, ආචාර්යය ප්‍රියදර්ශනී ප්‍රේමරත්න මහත්මිය හා ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ සමාජ අධ්‍යයන දෙපාර්තමේන්තුවේ කථිකාචාර්යය කේ.ජී.ඒ.අයි. කොඩිතුවක්කු මහතා විසින් ලබා දෙන ලදී. සංවර්ධන නිලධාරී එච්.එම්.ජී.කේ.නවරත්න මහත්මිය විසින් පුහුණුව සම්බන්ධිකරණය සිදු කල අතර පුහුණුව සඳහා පිළිමතලාව හා බොරැල්ල පුහුණු මධ්‍යස්ථානයේ කාර්යය මණ්ඩල නිලධාරින් සහභාගී වන ලදී.







පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ පුහුණු වැඩමුළුවේ හතරවන අදියර 2025.12.08 දින ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ඩබ්. කේ. එන්. එන්. කෞශල්‍යා මහත්මියගේ මුලිකත්වයෙන් පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානයේදී පවත්වන ලදී.

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ සමාජ අධ්‍යයන දෙපාර්තමේන්තුවේ කථිකාචාර්යය කේ.ජී.ඒ.අයි. කොඩිතුවක්කු මහතා විසින් පුහුණුව සඳහා සම්පත් දායකත්වය ලබා දෙන ලදී. පුහුණුව සම්බන්ධිකරණය සංවර්ධන නිලධාරී එච්.එම්.ජී.කේ.නවරත්න මහත්මිය විසින් සිදු කල අතර පුහුණුව සඳහා පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානයේ කාර්යය මණ්ඩල නිලධාරින් සහභාගී වන ලදී.







## ධාරිතා සංවර්ධන වැඩසටහන යටතේ පර්යේෂණ ක්‍රමවේදය පිළිබඳ වැඩමුළුව

2025.10.26 වන දින ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂන ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ඩබ්. කේ. එන්. එන්. කෞශල්‍යා මහත්මියගේ මුලිකත්වයෙන් මෙම පුහුණු වැඩමුළුවේ පස්වන අදියර පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානයේදි පවත්වන ලදි.

ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලයේ සමාජ අධ්‍යයන දෙපාර්තමේන්තුවේ කථිකාචාර්යය කේ.ජී.ඒ.අයි. කොඩිතුවක්කු මහතා විසින් සම්පත්දායකත්වය ලබා දෙන ලදි. සංවර්ධන නිලධාරී එච්.එම්.ජී.කේ.නවරත්න මහත්මිය විසින් පුහුණුව සම්බන්ධිකරණය සිදු කල අතර පුහුණුව සඳහා පිළිමතලාව  පුහුණු මධ්‍යස්ථානයේ කාර්යය මණ්ඩල නිලධාරින් සහභාගි වන ලදි.







## ආයතනයේ භෞතික සංවර්ධනය උදෙසා පැවති සාකච්ඡාව

2025.10.28 වන දින ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ අතිරේක ලේකම් මේනක හේරත් මහතා විසින් ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය නිරීක්ෂණය සිදු කරන ලදි. මෙදින ආයතනයේ සංවර්ධනය පිළිබඳ සාකච්ඡා කළ අතර මේ සඳහා ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ තිළිණි සුරංගිකා කරස්නාගොඩ මහත්මිය හා පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ඩබ්. කේ. එන්. එන්. කෞශල්‍යා මහත්මිය හා පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානයේ කාර්යය මණ්ඩල නිලධාරීන් ද සහභාගී වන ලදි.







## ග්‍රාමසංවර්ධන සමිති ශක්තිමත් කිරිමේ කාර්යබද්ධ පුහුණු වැඩමුළුව

2025.11.03 හා 04 දෙදින පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානයේදී ව්‍යාපෘති කළමණාකරණය හා සැලසුම්කරණ පුහුණුව පවත්වන ලදි. මධ්‍යම පළාතේ ග්‍රාමසංවර්ධන සමිති නිලධාරීන් සඳහා පැවති මෙම වැඩමුළුවේ සම්පත් දායකත්වය පුහුණු හා පර්යේෂණ නිලධාරී ඒ.එම්.එස්.අතපත්තු මහතා, පුහුණු හා පර්යේෂණ නිලධාරී කේ.එම්.ජී.සමරසේන මහතා, පුහුණු හා පර්යේෂණ නිලධාරී ඩී.ඒ.පී.දාස්වත්ත මහත්මිය විසින් සම්පත් දායකත්වය ලබා දෙන ලදි. වැඩමුළුවේ සම්බන්ධිකරණය සංවර්ධන නිලධාරී මල්ෂානි ආනන්ද මෙනවිය විසින් සිදු කරන ලදි.

ව්‍යාපෘති සැලසුම්කරණය හා කළමණාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන 2025.12.10 හා 11 යන දෙදින පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානයේදී පවත්වන ලදි. මධ්‍යම පළාතේ ග්‍රාමසංවර්ධන සමිති නිලධාරීන් සඳහා පැවති මෙම වැඩමුළුවේ සම්පත් දායකත්වය පුහුණු හා පර්යේෂණ නිලධාරී ඒ.එම්.එස්.අතපත්තු මහතා, පුහුණු හා පර්යේෂණ නිලධාරී කේ.එම්.ජී.සමරසේන මහතා, පුහුණු හා පර්යේෂණ නිලධාරී ඩී.ඒ.පී.දාස්වත්ත මහත්මිය විසින් සම්පත් දායකත්වය ලබා දෙන ලදි. සංවර්ධන නිලධාරී මල්ෂානි ආනන්ද මෙනවිය විසින් සම්බන්ධිකරණය සිදු කරන ලදි.









# මාසික ප්‍රගති සමාලෝචනය

මාසික ප්‍රගතිය පිළිබඳ කාර්යය මණ්ඩල සාකච්ඡාවක් 2025.09.31 වන දින ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ තිළිණි සුරංගිකා කරස්නාගොඩ මහත්මිය හා පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ඩබ්.කේ.එන්.එන්.කෞශල්‍යා මහත්මිය හා බොරලැස්ල පුහුණු මධ්‍යස්ථානයේ නියෝජ්‍ය (සැලසුම්) අධ්‍යක්ෂ එච්.එම්.එම්. රුවයිත් මහතාගේ මුලිකත්වයෙන් පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානයේදි පවත්වන ලදි. මේ සඳහා පිළිමතලාව හා බොරලැස්ල පුහුණු මධ්‍යස්ථානවල කාර්යය මණ්ඩල නිලධාරීන් සහභාගි වන ලදි.

2025 වර්ෂයේ ප්‍රගතිය සාකච්ඡා කිරිමේ ප්‍රගති සමාලෝචන රැස්වීම 2025.12.24 වන දින පුහුණු මධ්‍යස්ථානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ඩබ්.කේ.එන්.එන්. කෞශල්‍යා මහත්මිය හා බොරලැස්ල පුහුණු මධ්‍යස්ථානයේ නියෝජ්‍ය (සැලසුම්) අධ්‍යක්ෂ එච්.එම්.එම්. රුවයිත් මහතාගේ මුලිකත්වයෙන් පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානයේදී පවත්වන ලදි. පිළිමතලාව හා බොරලැස්ල පුහුණු මධ්‍යස්ථානවල කාර්යය මණ්ඩල නිලධාරින් මේ සඳහා සම්බන්ධ වන ලදි.









## ප්‍රජාශක්ති ජාතික වැඩසටහන අදාළ පුහුණු මොඩියුල සකස් කිරීම

### සමාජ සජීවිකරණය ............

ප්‍රජාශක්ති ජාතික වැඩසටහනේ නිරත ක්ෂේත්‍ර නිලධාරින්ගේ දැනුම, කුසලතා හා ආකල්ප සංවර්ධනය කිරීම උදෙසා ප්‍රජාශක්ති වැඩසටහනට අදාළ පුහුණු වැඩසටහන්වලට අදාළ සමාජ සජීවිකරණය පුහුණු මොඩියුලය 2025.11.06 වන දින සකස් කරන ලදි. මේ සඳහා බොරැල්ල හා පිළිමතලාව කාර්යය මණ්ඩල නිලධාරින් සහභාගි වූ අතර සම්පත් දායකත්වය ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ විශ්‍රාමික පුහුණු හා පර්යේෂණ නිලධාරී සුනන්ද සිරිසේන මහතා විසින් ලබා දෙන ලදි.





### ව්‍යාපෘති සැලසුම්කරණය හා කළමණාකරණය.....

2025.11.07 වන දින ව්‍යාපෘති සැලසුම්කරණය හා කළමණාකරණයට අදාළ පුහුණු මොඩියුලය සකස් කිරීම සඳහා සම්පත් දායකත්වය SLIDA ආයතනයේ හිටපු නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් ඩබ්.එම්.එම්.ජී.ඩී. විරකෝන් මහතා විසින් ලබා දෙන ලදි. මෙ සඳහා බොරැල්ල හා පිළිමතලාව කාර්යය මණ්ඩලය සහභාගි වන ලදි.





# ප්‍රජාශක්ති ජාතික වැඩසටහන අදාළ පුහුණු මොඩියුල සකස් කිරීම

## උපදේශනය හා ආකල්ප සංවර්ධනය.............

2025.11.10 වන දින උපදේශනය හා ආකල්ප සංවර්ධන පුහුණු මොඩියුල සකස් කරන ලදි. ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීම් අමාත්‍යාංශයේ උපදේශන අංශයේ මනෝ උපදේශන නිලධාරී සුසන්ත බණ්ඩාර මහතා විසින් සම්පත් දායකත්වය ලබා දෙන ලදි.







## ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධන..........

ප්‍රජාශක්ති ජාතික වැඩසටහන සඳහා ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධන පුහුණු මොඩියුල සකස් කිරිම 2025.11.11 වන දින බොරැල්ල පුහුණු මධ්‍යස්ථානයේදී සිදු කරන ලදි. මේ සඳහා සම්පත් දායකත්වය පරිසර අමාත්‍යාංශයේ අතිරේක ලේකම් සුදීර මහතා විසින් ලබා දෙන ලදි.







## ප්‍රජාශක්ති ජාතික වැඩසටහන අදාළ පුහුණු මොඩියුල සකස් කිරීම

### සහභාගිත්ව නායකත්ව කුසලතා සංවර්ධනය........

2025.11.12 වන දින සහභාගිත්ව නායකත්ව කුසලතා සංවර්ධනය පුහුණු මොඩියුල සකස් කිරීම බොරුල්ල පුහුණු මධ්‍යස්ථානයේදි සිදු කරන ලදි. මේ සඳහා සම්පත් දායකත්වය ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ විශ්‍රාමික පුහුණු හා පර්යේෂණ නිලධාරී සුනන්ද සිරිසේන මහතා විසින් ලබා දෙන ලදි.







### තොරතුරු තාක්ෂණයේ නව භාවිතයන්.......

රාජ්‍ය සේවය කාර්යක්ෂම කිරිමට තොරතුරු තාක්ෂණයේ නව භාවිතයන් පිළිබඳ පුහුණු මොඩියුල සකස් කිරිම පිළිබඳ පුහුණුව 2025.12.12 වන දින අධ්‍යක්ෂ තිළිණි සුරංගිකා කරස්නාගොඩ මහත්මියගේ මුලිකත්වයෙන් බොරැල්ල පුහුණු මධ්‍යස්ථානයේදී පවත්වන ලදි. මෙම පුහුණු වැඩමුළුවට සම්පත් දායකත්වය ගොඩනැගිලි ඉංජිනේරු කාර්යාලයේ සැලසුම් ශිල්පී සම්පත් සාගර මහතා විසින් ලබා දෙන ලදි. බොරැල්ල හා පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානවල කාර්යය මණ්ඩල නිලධාරින් මේ සඳහා සහභාගි වන ලදි.







# ප්‍රජාශක්ති ජාතික වැඩසටහන අදාළ පුහුණු මොඩියුල සකස් කිරීම

## ක්‍රියාවලි නම්‍යකරණය

2025.12.15 දින ක්‍රියාවලි නම්‍යකරණය පිළිබඳ පුහුණු මොඩියුල සකස් කිරිමේ වැඩමසුළුවක් බොරැල්ල පුහුණු මධ්‍යස්ථානයේදී පවත්වන ලදි. මේ සඳහා සම්පත් දායකත්වය ජනාධිපති ලේකම් කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම් සාවිත්‍රී ගුණතිලක මහත්මිය විසින් සිදු කරන ලදි.





## ආපදා කළමනාකරණය

ප්‍රජාශක්ති වැඩසටහනට අදාළ කාලීන මාතෘකාවක් වන ආපදා කළමණාකරණය පිළිබඳ පුහුණු මොඩියුල සකස් කිරිමේ වැඩමුළුවක් 2025.12.16 වන දින පැවිත්විය. ශ්‍රී ලංකා සංවර්ධන හා පරිපාලන ආයතනයේ විශ්‍රාමික අතිරේක අධ්‍යක්ෂ ජනරාල් නේරංජලා ජයසුන්දර මහත්මිය විසින් සම්පත් දායකත්වය ලබා දෙන ලදි. බොරැල්ල හා පිළිමතලාව කාර්යය මණ්ඩල නිලධාරින් මෙම පුහුණුව සඳහා සහභාගි වන ලදි.







# ආයතනයේ ඵලදායිතා ප්‍රවර්ධනය උදෙසා ........

2025.11.07 වන දින ආයතනයේ ඵලදායිතාව ප්‍රවර්ධන උදෙසා පුහුණු වැඩමුළුවක් අධ්‍යක්ෂ තිළිණි සුරංගිකා කරස්නාගොඩ මහත්මියගේ මූලිකත්වයෙන් බොරැල්ල ප්‍රධාන කාර්යාලයේදී පවත් වන ලදි.







2025.11.21 වන දින පිළිමතලාව ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ඩබ්.කේ.එන්.එන්.කෞශල්‍යා මහත්මියගේ මූලිකත්වයෙන් පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානයේදි පවත්වන ලදි. පුහුණුව සඳහා සම්පත් දායකත්වය මහනුවර ඵලදායිතා සංවර්ධන නිලධාරී අමිල ප්‍රභාත් අතුකෝරාළ මහතා විසින් ලබා දෙන ලදි. මේ සඳහා කාර්යය මණ්ඩල නිලධාරින් සහභාගි වන ලදි.







## ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහනට අදාළ ව්‍යාපෘති ඇගයුම් මෙහෙයුම් ක්‍රියාවළිය .......

### බදුල්ලට......

ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක ව්‍යාපෘති ඇගයුම් මෙහෙයුම් ක්‍රියාවළියක් ග්‍රාම සංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනය විසින් සිදු කරමින් පවති. බදුල්ල දිස්ත්‍රික්කයේ අර්තාපල් බීජ වගාව පිළිබඳ ව්‍යාපාතිය නිරික්ෂණය කිරීම සඳහා ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ තිළිණි සුරංගිකා කරස්නාගොඩ මහත්මිය ඇතුළු කාර්යය මණ්ඩල නිලධාරීන් සහභාගි විය.







### උඩුබද්දාවට................

උඩුබද්දාව ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ හබරවැව රොන්මඩ ඉවත් කිරිම, මත්ස්‍ය පැටවුන් තැන්පත් කිරිමේ ව්‍යාපෘතිය සහ ගම මැද මාර්ගය තාර දැම්මේ ව්‍යාපෘතිය ඇගයුම් මෙහෙයුම් ක්‍රියාවළිය සඳහා නිරික්ෂණය කිරීම සිදු කරන ලදි. මෙය සඳහා ග්‍රාමසංවර්ධන අභයාස හා පර්යේෂණ ආයතනයේ පුහුණු හා පර්යේෂණ නිලධාරී චිත්‍රා ජයසිංහ මහත්මිය හා පුහුණු නිලධාරි බණ්ඩාර මහතා ද, උඩුබද්දාව ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ නිලධාරින්, ගොවිජන සේවා මධ්‍යස්ථානයේ නිලධාරින් හා ගොවි සමිතියේ නිලධාරින් සම්බන්ධ විය.







# ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහනට අදාළ ව්‍යාපාත් ඇගයුම් මෙහෙයුම් ක්‍රියාවළිය

## අගුණකොළපැලැස්සට........

හම්බන්තොට අගුණකොළපැලැස්ස ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශයේ අගුණකොළපැලැස්ස වැව ආශ්‍රිත බහුකාර්යය සංවර්ධන වැඩසටහන නිරික්ෂණය කිරීම සිදු කරන ලදි. මේ සඳහා ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ තිළිණි සුරංගිකා කරස්නාගොඩ මහත්මිය ඇතුළ නිලධාරින්, අගුණකොළපැලැස්ස ප්‍රාදේශිය ලේකම් කායීාලයේ ප්‍රාදේශිය ලේකම් ඇතුළු නිලධාරින් හා සභාපති ඇතුළු නිලධාරින් සහභාගි විය.







## මාතලේට................

මාතලේ දිස්ත්‍රික්කයේ අංකන්ද එල්ලෙන පාලම ප්‍රතිසංස්කරණය කිරිමේ ව්‍යාපෘතිය නිරික්ෂණය සඳහා පිළිමතලාව පුහුණු මධ්‍යස්ථානයේ නියෝජ්‍ය අධ්‍යක්ෂ ඩබ්.කේ.එන්.එන්.කෞශල්‍යා මහත්මිය ඇතුළු නිලධාරින් 2025.11.23 වන දින සහභාගි විය. මෙම අවස්ථාව සඳහා මාතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සභාපති, මාතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යායේ සහකාර සැලසුම් අධ්‍යක්ෂ, අංකන්ද වසමට අදාළ ක්ෂේත්‍ර නිලධාරින් සහ මාතලේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ නිලධාරින් ද මේ සඳහා සහභාගි විය.







## ඒකාබද්ධ ග්‍රාමීය සංවර්ධන වැඩසටහනට අදාළ ව්‍යාපාත් ඇගයුම් මෙහෙයුම් ක්‍රියාවළිය

### මාතරට........

ඒකාබද්ධ ග්‍රාමිය සංවර්ධන වැඩසටහන යටතේ ක්‍රියාත්මක වන ව්‍යාපෘති ඇගයුම් මෙහෙයුම් ක්‍රියාවළිය තවත් එක් ව්‍යාපෘතියක් ලෙස මාතර දිස්ත්‍රික්කයේ අතුරලිය ප්‍රාදේශිය ලේකම් කෝට්ඨාශයේ එළු පාලනය ව්‍යාපෘතිය නිරික්ෂණය කරන ලදි. මෙ සඳහා බොරැල්ල මධ්‍යස්ථානයේ නියෝජ්‍ය (සැලසුම්) අධ්‍යක්ෂ එච්.එම්.එම්.රුවයිත් මහතා ඇතුළු නිලධාරින් සම්බන්ධ විය.







### ගාල්ලට................

ගාල්ල දිස්ත්‍රික්කයේ ඉමදුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ උණ භාවිත ඉඩම්වල තේ වගාව තුළින් ජනතාවගේ ජිවනෝපාය සංවර්ධනය ව්‍යාපෘතිය නිරික්ෂණය සඳහා බොරැල්ල මධ්‍යස්ථානයේ නියෝජ්‍ය (සැලසුම්) අධ්‍යක්ෂ එච්.එම්.එම්.රුවයිත් මහතා ඇතුළු නිලධාරින් සම්බන්ධ විය.







## දමිළ මාධ්‍යයෙන් පුහුණුකරුවන් පුහුණු කිරිම ............

2025.12.26 හා 27 යන දෙදින දමිළ මාධ්‍යයෙන් පුහුණුකරුවන් පුහුණු කිරිමේ වැඩසටහනක් පැවිත්විය. 2026 වසරේදි ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයට අදාළව පුහුණු කටයුතු සිදු කිරිමේදී අවශ්‍ය වන දමිළ භාෂාවෙන් සම්පත් දායකයින් කාණ්ඩායමක් බිහි කර ගැනීම මෙම වැඩමුළුවේ මුලික අරමුණයි. මේ සඳහා සම්පත් දායකත්වය ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ නියෝජ්‍ය (සැලසුම්) අධ්‍යක්ෂ එච්.එම්.එම්. රුවයිත් මහතා විසින් ලබා දෙන ලදි. මෙම අවස්ථාව සඳහා ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා පර්යේෂණ ආයතනයේ අධ්‍යක්ෂ තිළිණි සුරංගිකා කරස්නාගොඩ මහත්මිය සම්බන්ධ විය. සම්බන්ධිකරණය පුහුණු හා පර්යේෂණ නිලධාරි චම්පා අල්විස් මහත්මිය විසින් සිදු කරන ලදි.








| | |
|---|---|
| **උපදේශකත්වය** | තිළිණි සුරංගිකා කරස්නාගොඩ<br>අධ්‍යක්ෂ<br>ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා<br>පර්යේෂණ ආයතනය |
| | ඩබ්.කේ.එන්.එන්.කෞශල්‍යා<br>නියෝජ්‍ය අධ්‍යක්ෂ<br>ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා<br>පර්යේෂණ ආයතනය |
| | එච්.එම්.එම්. රුවයිත්<br>නියෝජ්‍ය (සැලසුම්)අධ්‍යක්ෂ<br>ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා<br>පර්යේෂණ ආයතනය |
| **සංස්කාරක** | |
| | එච්.එම්.ජී.කේ.නවරත්න<br>සංවර්ධන නිලධාරී<br>ග්‍රාමසංවර්ධන අභ්‍යාස හා<br>පර්යේෂණ ආයතනය |

# අපෙන් ඔබට ............

- **සමාජ සජීවීකරණය**
- **ව්‍යවසායකත්ව කුසලතා සංවර්ධනය**
- **ප්‍රජා සහභාගීත්ව ව්‍යාපෘති සැලසුම්කරණය හා කළමනාකරණය**
- **ගෘහ කළමණාකරණය හා පවුල් සංවර්ධනය**
- **සහභාගීත්ව නායකත්ව කුසලතා සංවර්ධනය**
- **ප්‍රජාමූල සංවිධාන කළමණාකරණය**
- **පුහුණු වැඩසටහන් සැලසුම්කරණය හා කළමණාකරණය**
- **විපර්යකාරක පුහුණුකරු පුහුණුව**

මෙම පුහුණු පාඨමාලා සඳහා රාජ්‍ය හා රාජ්‍ය නොවන සියළුම නිලධාරීන් හට ඉල්ලුම් කිරීමේ හැකියාව ඇත. ඉහළ දැනුමක් හා පිළිගත් සහතිකයක් පිරිනැමේ. ඔබ ආයතනයේත් බාහිර පුහුණු සඳහා දේශනශාලා, නේවාසිකාගාර පහසුකම්, භෝජනාගාර පහසුකම් සඳහා අදම අප ආයතනය අමතන්න

**බොරැල්ල - 0112695579**

**පිළිමතලාව - 0812579929**












